# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/25 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥපනත**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ **නියෝග.**

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥපනත යටතේ යම් පළාත් පාලන ආයතනයක යම් සභිකයකු තෝරා පත්කර ගැනීමේ කාර්යය සඳහා 1971 අප්‍රේල් 5 වන දින හෝ එදිනට පසු පැවැත්විමට නියමිත යම් ඡන්ද විමසීමක් මේ නියෝග බලපවත්වන තාක් කල් හා ඒ තාක් කල් පමණක් නොපවත්වනු ලැබිය යුතුය.

2. 1 වන නියෝගයෙහි " පළාත් පාලන ආයතනය " යන යෙදුමෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

53A——ඒ 24316— 2,100 (76/12)